# සාමුද්‍රික ශාස්ත්‍රය හෙවත් අංග ලක්‍ෂණ විද්‍යාව පිළිබඳ විමර්ශනයක්

**කුඩාවැවේ සෝමානන්ද හිමි**

ශරීර ලක්‍ෂණ, හැසිරීම බලා ඔවුනොවුනගේ ගතිගුණ හඳුනාගෙන ශුභාශුභ ඵල විපාක කීම සාමුද්‍රික ශාස්ත්‍රයෙන් ගෙනහැරපානු ලැබේ. එහිදී ස්ත්‍රී ලක්‍ෂණ, පුරුෂ ලක්‍ෂණ, නපුංසක ලක්‍ෂණ ආදිය පිළිබඳව සාමුද්‍රික ශාස්ත්‍රයෙන් අවධානයට යොමු කෙරේ. ඒ අනුව "සාමුද්‍රික ලක්‍ෂණ පාඨක (ශාස්ත්‍රය) යනු අතෙහි රේඛා ආදී වශයෙන් ශරීරයෙහි පිහිටා තිබෙන ලකුණු බලා පලාඵල කියන, ශරීරයෙහි පිහිටි ලකුණු බලා මනුෂ්‍යයන්ට වන්නා වූ ශුභාශුභ පල දැනගන්නා සැටි උගන්වන ශාස්ත්‍රය සාමුද්‍රික ශාස්ත්‍රයයි. සමුද්‍ර නම් ඍෂීන් විසින් උපදවන ලද හෙයින් මෙය සාමුද්‍රිකා ශාස්ත්‍ර නම් විය. 'පාඨක' යන්නේ අර්ථය නම් "කියන්නා" යනුවෙන් පෙන්වා දිය හැකියි.[1]

ඇතැම්හු උප්පත්තියෙහි දී ම විශේෂිත අංග ලක්‍ෂණ වලින් යුක්ත වෙති. ඒ අනුව සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේට විශේෂ තැනක් හිමි වේ. උන්වහන්සේ උසස්, ශ්‍රේෂ්ඨ හෝ උත්තරීතර පුරුෂයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ



මනුෂ්‍යයෙකි.[2] බුදුවරු මහා පුරුෂ ලෙස හඳුන්වනු ලැබෙති.[3] මේ සම්බන්ධයෙන් සැරියුත් හිමියන් බුදුරජාණන් වහන්සේගෙන් විචාළ අවස්ථාවන්හි දී මෙම සංකල්පය පිළිබඳව විග්‍රහ කර ඇති අයුරු ද පෙනෙයි.[4] උන්වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ වලින් හා අනුව්‍යංජන වලින් හෙබි උතුමකු වූහ.[5] තවද බුදුන්ගේ ශ්‍රී පතුල ද මඟුල් ලකුණින් සමන්විත වේ.[6] බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ පිළිබඳව **මජ්ඣිමනිකාය** සේල සූත්‍රයෙහිත්, **සූත්‍රනිපාත** වත්ථුගාථාවන්හි,[7] **දීඝනිකායේ** මහාපදාන සූත්‍රයෙහිත්, ලක්ඛණ සූත්‍රයෙහිත්,[8] **මජ්ඣිමනිකායේ** බ්‍රහ්මායු සූත්‍රයෙහිත්[9] දක්නට ලැබේ.

මහාමායා දේවියත් ප්‍රජාපති දේවියත් යන දෙපල උතුම් වූ ස්ත්‍රී ලක්‍ෂණයෙන් යුතුව සිටි අතර නිමිති ප්‍රකාශකයන් කියා සිටියේ මොවුන් ප්‍රසූත කරන පුත්‍රයන් අනාගතයෙහි දී චක්‍රවර්තීහු වෙතියි යන්නයි.[10] එසේම **දීඝනිකායේ** ශීලක්ඛන්ධ වර්ගයේ[11] එන සූත්‍රවල භාරතයේ සිටි අසිත, කාලදේව වැනි ඍෂිවරු ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රයෙහි පුළුල් අවබෝධයෙන් යුක්ත වූවන් වශයෙන් දැක්විය හැකිය. සුද්ධෝදන රජු චතුර් වේදයෙහි නිපුණ වූ බ්‍රාහ්මණයන් එකසිය අටක් ගෙන්වා සත්කාර කොට දරුවාගේ ලක්ෂණ බලා අනාවැකි කීමට නියෝග කළ අතර ඔවුන් අතරින් හැමදෙනාටම ශිල්ප දුන් රාමය, ධජය, ලක්ෂණය, මන්තීය, භොජය, සුයාමය සහ සුදත්ත යන වැඩිමාලු සත්දෙන ආචාර්ය්‍ය බමුණන් දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හා අසූ අනුව්‍යංජන බලා චක්‍රවර්ති රජ හෝ බුදුවන බව කියූහ.[12]

ඔවුන් සත්දෙනාටම බාල සුදත්ත කොණ්ඩඤ්ඤ බමුණු ආචාර්යවරයා "ඌර්ණ ලොම ධාතුව සුදු සේ දැක චක්‍රවර්ති වේ නම් මේ ලොමය රන් තිලකයක් සේ තිබෙයි, බුදු වන්නාහට මකුල් තිලකයක් සේ තිබෙයි. ඒකාන්තයෙන් මේ කුමර බුදු වේමය"යි සිද්ධාර්ථ කුමාරයා ඒකාන්තයෙන් බුදුවෙන බව එකහෙලාම කීමට කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයාට[13] හැකිවූයේ ද ජ්‍යොතිෂ්‍යයේ එක් අංශයක් වූ අංග ලක්ෂණ විද්‍යාව අනුවය.

සිද්ධාර්ථ කුමාරයාගේ මහපුරුෂ ලක්‍ෂණ කාළදේවල තවුසා දැනගත්[14] අතරම කුමරුට නම් තබන දිනයෙහි දී ශරීර ලක්‍ෂණ බලා අනාවැකි ද පළ කළේය. නන්ද කුමරු පැවිදි කොට සත්වන දවස්හි සිඟා වඩින බුදුන් පෙන්වා "තොප සක්විති වන නියාව දෙතිස් මහ පිරිමිනි ලකුණු නැමැති නිමිත්ත දන්නා දෙතිස් දෙනෙකු කියා සිටුත් වස්තුවත් වුවමනා වේද? තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව' යි" රාහුල කුමාරයා යැවීමෙන් පැහැදිලි වන්නේ ඔහුත් දෙතිස් මහා පුරුෂ ලකුණින් යුතු වූවා පමණක් නොව එමඟින් සක්විති වන බව ද පැවසූ බවකි.[15] මාගන්දි මව් බැමිණිය බුදුරජාණන් වහන්සේ පංචකාමයන් සේවනය නොකරන උතුමකු වශයෙන් ප්‍රකාශ කරණු ලැබුවේ උන්වහන්සේගේ පාද සලකුණු පරීක්‍ෂා කිරීමෙනි.[16] "බැමිණියෝත් ලක්‍ෂණ මන්ත්‍ර යහපත්ව දන්නා හෙයින් බමුණ, මේ පත්ල ගිහිව සිටි කෙනෙකුන්ගේ පත්ලෙක් නොවෙයි කියාලා"යනුවෙන් **සද්ධර්මරත්නාවලියෙහි** මාර දූන් තුන්දෙනාගේ වස්තුවෙහි ද සඳහන් වේ.[17]



අංග ලක්‍ෂණ විද්‍යාව දන්නා අය 'අංග විජ්ජා පාඨකා හෙවත් අංග විජ්ජා දන්නා' සිරුර බලා ලකුණු කියන්නවුන් ලෙස සඳහන් වේ.[18] තාරුණ්‍යයත් සමඟ ස්ත්‍රීන්ගේ වැඩී වර්ධනය වන අංගෝපාංගයක් වන්නේ පංච කල්‍යාණයයි.[19] එනමුදු ළදැරි අවදියෙහි ද එහි මූලික ලක්‍ෂණ පිළිබිඹු වන බවක් ද පවසනු ලබේ. නක්‍ෂත්‍ර පාඨකයන් විසින් ප්‍රජාපතී ගෝතමියට නම් තබන ලද මඟුලෙහි දී ඇය සතු වූ පංච කල්‍යාණ ආදී නොයෙකුත් ස්ත්‍රී ලක්‍ෂණ[20] දක්නා ලදි.[21] පුරුෂ[22] යන්නට ද සමානව යෙදෙන පර්යාය පද රැසක් තිබෙන අතර සූර්යයා, සමුද්‍රය වැනි ගම්භීර දේ සඳහා සමාන කොට ඇති බවත් පෙනෙයි.[23] ඉන් වැඩි ගෞරවණීය මෙන්ම තේජවන්ත භාවයක් ආරූඪ කිරීමේ අපේක්‍ෂාව විය. ස්ත්‍රීන්ට හිමි ලක්‍ෂණ මෙන්ම පුරුෂත්වය සඳහා විදහාපාන ලක්‍ෂණ පිළිබඳව ද සඳහන්ව ඇති බවක් පෙනේ. **විසුද්ධිමාර්ගයේ**[24] දැළි රැවුළ ආදිය පුරුෂ නිමිති වශයෙන් ද **විසුද්ධිමාර්ග සන්නයේ**[25] දැළි රවුළු නැති බව ස්ත්‍රී නිමිත්තක් වශයෙන් ද දැක්වෙයි.

**ධම්පියා අටුවා ගැටපදයේ**[26] ලක්‍ෂණ මන්ත්‍ර (සලක්ඛණමන්තානං) නම් වු මහා පුරුෂ ලක්‍ෂණාදිය ගෙනහැර දැක් වූ ග්‍රන්ථ විශේෂයක් පැවැති බවක් පෙනෙයි. මාගන්දියා මව් බැමිණිය මෙම ලක්‍ෂණ මන්ත්‍ර මනාව උගත් තැනැත්තියකි.[27] ඇය බුදුන්ගේ පා සලකුණු වලින් උන්වහන්සේ උතුමකු බව හඳුනා ගත්තාය.[28] බාවාරිය තවුසාගේ ශිෂ්‍යයෝ ද සැවැත් නුවරට වැඩි බුදුන්ගේ පියවර සටහනක් දැක වේද මන්ත්‍රවලට අනුව ඒවා මගින් බුදුන්

වහන්සේ බව හඳුනා ගත්හ.[29] කුම්භඝෝෂකගේ කට හඬ අනුව ඔහු නිසැකයෙන්ම ධනවතෙකු විය යුතු බව රජු විසින් නිශ්චය කළේය.[30]

නන්ද කුමරු ද මහාපුරුෂ ලක්‍ෂණ වලින් යුක්ත වූවකු විය.[31] ඔහු චක්‍රවර්ති රජු වීම සඳහා සුදුසු භාග්‍ය සම්පන්නව උපන් අයෙකි.[32] එසේම චක්‍රවර්ති රාජ්‍යයත්වයට සුදුසු පුණ්‍ය මහිමයෙන් යුක්තව උපන් තවත් අයෙකු වූයේ මහාපුරුෂ ලක්‍ෂණයන්ගෙන් යුත් සුළුකළිඟු කුමාරයාට දාව මධු රජු දියණිය බිහිකරන ලද කුමරුය.[33] කලිඟු රජු කාලයේ දරුවන් දෙදෙනාගේ ලක්‍ෂණ බලා නෛමිත්තකයෝ පියාගේ ඇවෑමෙන් මහකලිඟු කුමරා එනුවර රජ වන බවත් සුළුකළිඟු කුමරා තාපස වේසධාරී වන බවත් ඔහුගේ පුතකු චක්‍රවර්ති රාජ්‍යයත්වයට පත්වන්නේයැයි කීහ.[34] මධු රජු දියණිය උපන් පසු ඇයගේ ලක්‍ෂණ බලා නෛමිත්තකයෝ අනාවැකි පල කළහ.[35] කොසොල් මහරජතුමාගේ පුරෝහිත බමුණාගේ පුත්‍රයා වුණු බාවාරි හෙවත් පාවාරි කුමාරයා ද මහාපුරුෂ ලක්‍ෂණ තුනකින් යුක්ත වූවෙකි.[36] එම මහාපුරුෂ ලක්‍ෂණ ත්‍රිත්වය වන්නේ තම දිවෙන් මුහුණ වැසීමට හැකි බවත්, නළලෙහි ඌර්ණ රෝමයත්, ඇතුළත සැඟවුණු අංග ජාතය යන ලක්‍ෂණයන්ය.[37]

බොහෝ අනෙකුත් ශාස්ත්‍ර සේම මේ ශාස්ත්‍රය කෙරෙහි හින්දූ ආර්යයන්ගේ බලපෑම මත මේරට ද ව්‍යාප්ත වූ බවක් පෙනේ. මේරට සිංහලයන් දේහ ලක්ෂණ විද්‍යාව ස්වකීය කටයුතු සඳහා භාවිතයට ගත් බව



**සද්ධර්මාලංකාරයේ** එන අශෝකමාලා, ජයම්පතිකා වැනි කතා පුවත් තුළින් පැහැදිලි වේ. මෙම ශාස්ත්‍රය ආවාහ විවාහයෙහිදීත් මිතුරන් තෝරාගැනීමේදීත් මෙහෙකරුවන් ලබාගැනීම ආදී දෑ වල දී යොදාගැනීමට හැකි, යොදා ගැනෙන බව පෙන්වා දිය හැකිය. මෙම ශාස්ත්‍රයෙහි දක්ෂ වූවන් ලක්දිව මුල් අවදියේ සිටම සිටි බවත් පෙනේ. පණ්ඩුල බ්‍රාහ්මණයා පණ්ඩුකාභය කුමරුගේ හස්ත රේඛා බලා ඔහු ලක්දිව රජවෙන බව කිවේය. සාමුද්‍රික ලක්‍ෂණ අනුව යමින් සඟබෝ කුමරුගේ අඟ පසඟ බලා මේ රට ඒකච්ඡත්‍රකොට බොහෝ ආශ්චර්ය, අද්භූත, වීර චරිතයක් වන බව ද පැවසුයේ සාමුද්‍රික ශාස්ත්‍රඥයෝය. තවද සංඝතිස්ස ආදී කුමරුන් තුන්දෙනාගේ පිය ගැටෙන්නා වූ ශබ්දය ශ්‍රවණය කොට ඔවුන් තිදෙනාම ලක්දිව රජවන බව කියා සිටියේ ද දෑස් නොපෙනෙන සාමුද්‍රික ශාස්ත්‍රඥයෙක්ය.[38]

රාජ දියණියකු වූ සමුද්දනාවා මෙහෙණිය ද මිහින්තලා ලිපියේ එන ශවෙර ශමණිය ද එකම භික්‍ෂුණියක් වශයෙන් සලකන මහාචාර්ය විමල විජයසූරිය ඇය විහාරමහාදේවි මෙහෙණිය වශයෙන් ද හඳුන්වා[38] ඇති මැය පිළිබඳව තොරතුරු ගෙනහැරපාන **වංසත්ථප්පකාසිනියේ** පින් ලකුණින් යුක්ත, ස්ත්‍රී දෝෂ වලින් තොර වූ පිරිසිදු, නොකැළැල් තැනැත්තියක් වශයෙන් සඳහන් කරයි.[39]

**මහාවංසයට** අනුව අංග ලක්‍ෂණ විද්‍යාව පිළිබඳව දැනුමින් යුත් බ්‍රාහ්මණයන් සුභ රජුගේ දියණියක් රාජ කුමාරිකාවක් වශයෙන් හඳුනාගනු ලැබුවේ ද ඇයගේ ශරීර

ලක්ෂණ තුළින්ය.[40] **සද්ධර්මරත්නාවලියේ** සඳහන්ව ඇති තඹදැලි සොරාගේ වස්තුවේ කියැවෙන සොරදෙටුවා තමා කරා ආ පුද්ගලයාගේ ශරීර ලක්‍ෂණ බලා මොහු ගුණමකුවෙකු යැයි නිශ්චිතවම හඳුනා ගත්තේය.[41]

අභාසලමෙවන් රජු ද ස්වකීය පුත්‍රයා සාමුද්‍රික පාඨකයන්ට පෙන්වීම කළ බව "මහාවිහාරයට නුදුරු වූ එක්තරා ගමෙක්හි ''මහියඞ්ගණ නම් වු සෙලාහිය නම් වූ ක්‍ෂත්‍රිය රජෙක් වාසය කරන්නේ, පුතණු කෙනෙකුන් ලැබැ, සාමුද්‍රික ලක්‍ෂණ පාඨක බමුණනට දැක්වූයේයැ, ඔහු රාජ කුමාරයන්ගේ අඞ්ග ප්‍රත්‍යංගයෙහි ලක්‍ෂණ බලා, ''මේ රාජ කුමාරයන් වහන්සේ, වැළිත් ලාමක සත්ව කෙනෙකුන් වහන්සේ නොවන සේකැ. භාග්‍යයෙන් පවිත්‍ර වූ ධන්‍ය ලක්‍ෂණයෙන් සමෘද්ධ සේකැ. මේ සියලු සිංහලද්වීපය එකච්ඡත්‍ර කොටැ මහත් වූ ආශ්චර්ය්‍ය අද්භූත වූ වීර චරිතයන් දක්වන්නේය''යි ප්‍රකාශ කළෝ." යනුවෙන් **එළු අත්තනගලු වංශය** සඳහන් කරයි.[42] මයිල් නන්ද මහතෙරුන් වහන්සේ පියා මියගිය පසු සංඝබෝධි කුමාරයා විහාරයට ගෙන්වා පෝෂණ කොට ''ත්‍රිපිටක බුද්ධ වචනයන් උගන්වා, බාහිර ශාස්ත්‍රයෙහි ද අතිශයින් දක්‍ෂ කැරැවූ සේකැ''යනුවෙන් දැක්වීමෙන් පෙනෙන්නේ අධ්‍යාපනය ලබාදුන් බවක්ය.[43] මයිල් නන්ද මහතෙරුන් සාමුද්‍රික ලක්‍ෂණ දත් වූවන්ගේ වචනය විශ්වාස කර කුමාරයාට අනුරාධපුරයේ විසීම සුදුසු යැයි විශ්වාසය කොට සංඝතිස්ස සහ ගෝඨාභය යන අනෙකුත් ලැමැණි පක්‍ෂයේ යහළු රාජකුමාරවරුන් දෙදෙනෙකු සමඟ නික්මුණාහ.[44] ඒ යන අතරමඟ තිසාවැව



අසල දී දෑස් නැති, නුවණැති බමුණෙක්, ඒ කුමාරවරු තිදෙනාගේ පතුල් ශබ්දය අසා ශාස්ත්‍ර ලක්‍ෂණයට අනුව " මොවුන් තුන්දෙනාමැ සිංහලද්වීපයෙහි පෘථිවීශ්වර වෙති"යි ප්‍රකාශ කොට තිබේ.[45]

පැරකුම්බා කුමරුන් පිළිබඳව ද සාමුද්‍රික ශාස්ත්‍රඥයෝ අනාගත වාක්‍ය ප්‍රකාශ කළහ. බොහෝ අවස්ථාවල මෙම ශාස්ත්‍රයෙහි නිපුණයෝ වශයෙන් කියැවෙන්නේ බමුණන්ය. එනමුදු අවශේෂ සිංහලයන් මෙය නොදැන සිටියායැයි කිවහැකි නොවේ. මක්නිසාදයත් පරාක්‍රමබාහු කුමාරයා විසින් චරපුරුෂ සේවය සඳහා යොදවන ලද අය අතර බොහෝ පිරිසක් සාමුද්‍රික පාඨකයන් වශයෙන් හැසිරි ඇති හෙයිනි. **සද්ධර්මරත්නාවලියේ** කුම්භඝෝෂක සිටාණන්ගේ කථාවේ සියල්ලවුන්ගේ ශබ්දයෙහි විභාගය දන්නා බිම්බිසාර රජ්ජුරුවෝ බොහෝ වස්තු ඇති මිනිසකුගේ ශබ්දයකැයි කියුවේ කුම්භඝෝෂකගේ ශබ්දය ඇසීමෙනි.[46]

## ආන්තික සටහන්

1. එළුඅත්ත, (කුමාරතුංග), පි. 62
2. බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ මහා පුරුෂ සංකල්පය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2002
3. මහා බෝධිවංශ ග්‍රන්ථිපදය, (මබෝග්‍රප)සංස්. ගතාරේ ධම්මපාල හිමි, කඹුරුපිටිය විද්‍යානිකේතන විද්‍යායතන පිරිවෙන, 1985, පිටු. 12-13
4. එම.

5. 1. සුප්පතිට්ඨිත පාදා 2. හෙට්ඨාපාදතලේ සුචක්ඛනිජාතානි 3. ආයතපණ්හි 4. දීඝාඞ්ගුලි 5. බ්‍රහ්මුජ්ජුගතො 6. සත්තුස්සදො 7. මුදුතලුණහත්ථපාදෝ 8. ජාලහත්ථපාදෝ 9. උස්සංඛපාදෝ 10. උද්දග්ගලෝමෝ 11. ඒනිජංඝෝ 12.සුබුමච්ඡවි 13. සුවණ්ණාවණ්ණෝ 14. කෝසොහිතවත්ථගුය්හ 15. නිග්‍රොධපරිමණ්ඩලෝ 16. ඨිතකෝව අනෝනමන්තෝ උභෝනි පාදතලෙහි ජන්නුකානි පරිමසති 17. සීහපුබ්බද්ධකායෝ 18. විතන්තරංසෝ 19. සමවත්තක්ඛන්ධෝ 20. රසග්ගසග්ගී 21. අභිනීලනෙත්තෝ 222. ගෝපමුඛෝ 23. උණ්හිසසීසෝ 24. ඒකේනලෝමෝ 25. උණ්ණවම්භ මුඛන්තරේ 26. චත්තාළිස දන්තෝ 27. අවිරල දන්තො 28. පහුතජිව්හෝ 29. බ්‍රහ්මස්සරෝ 30. සීහහනු 31. සමදන්තෝ 32. සුසුක්කදාඨෝ. බුත්ස. පිටු.30, 65, 247-260, ධම්ප්‍ර.පිටු. 3, 12;"දෙතිසක් විතර මහා පුරුෂ ලක්ෂණයෙන් හා අශීත්‍යනුබ්‍යඤ්ජනයෙන් හා බ්‍යාප්‍රභාකේතුමාලායෙන් හා දසදිග පතල සවනක් බුදුරසින් හා කප් ගිනිගත් රුවන් මෙරක් මෙන් බබලමින් වැඩ සිටි"යනුවෙන්මට්ටකුණ්ඩලී දක්නා ලද බුදුරුව දක්වා තිබේ. **සර**, පිටු. 58, 592, 612, 230

6. පූජා. පිටු. 139-142

7. මජ්ඣිම නිකාය, (1882) කාණ්ඩ 1-3, ලන්ඩන්: පී. ටී. එස්.

8. දීඝනිකාය, (1890-1911), කාණ්ඩ 1-3, ලන්ඩන්: පී. ටී. එස්.

9. මජ්ඣිමනිකාය, (1882), කාණ්ඩ 1-3, ලන්ඩන්: පී. ටී. එස්.

10. පූජා, පි. 123

11. 1 අඞ්ග ලක්‍ෂණ ශාස්ත්‍රය 2 නිමිති ශාස්ත්‍රය, 3 උප්පාද 4 සුපිනක 5 ලක්ඛණ 6 මූසිකච්ඡින්න 7 අග්ගිහෝම 8 දබ්බිහෝම 9 ථුසහෝම 10 කණහෝම 11 තණ්ඩුලහෝම 12 සප්පිහෝම 13 තෙලහෝම 14 මුඛහෝම 15 ලෝහිත හෝම 16 අඞ්ගවිජ්ජා 17 වත්ථුවිජ්ජා 18 ඛෙත්තවිජ්ජා 19 සිවවිජ්ජා 20 භූතවිජ්ජා 21 භූරිවිජ්ජා 22 අහිවිජ්ජා 23 විසවිජ්ජා 24 විච්ඡිකවිජ්ජා 25 මූසිකවිජ්ජා 26 සකුණවිජ්ජා 27 වායසවිජ්ජා 28 පක්කජ්ඣාන 29 සරපරිත්තාණ 30 මිගචක්ක 31 මණිලකඛණ 32 දණ්ඩලක්ඛණ 33 සත්ථලක්ඛණ 34 ආවුධලක්ඛණ 35 ඉත්ථීලක්ඛණ 36 පුරිස ලක්ඛණ 37 කුමාරලක්ඛණ 38 කුමාරිලක්ඛණ 39 දාසලක්ඛණ 40 දාසිලක්ඛණ 41 හත්ථිලක්ඛණ 42 අස්ස ලක්ඛණ 43 මහිසලක්ඛණ 44 උසභලක්ඛණ 45 ගොලක්ඛණ 46 අජලක්ඛණ 47 මෙණ්ඩකලක්ඛණ 48 කුක්කුට ලක්ඛණ 49 වට්ටකලක්ඛණ 50



ගොධාලක්ඛණ 51 කණ්ණිකාලක්ඛණ 52 කච්ඡපලක්ඛණ 53 මිගලක්ඛණ 54 රඤ්ඤං නියානං 55 රඤ්ඤං අනියානං 56 අබ්භන්තරානං රඤ්ඤං උපයානං 57 බාහිරානං රඤ්ඤං අපයානං 58 බාරාහිනං රඤ්ඤං උපයානං 59 අබ්භනතරානං රඤ්ඤං අපයානං 60 අබ්භනතරානං රඤ්ඤං ජයො 61 බාහිරනාං පරාජයො 62 බාහිරානං රඤ්ඤං ජයො 63 අබ්භනතරානං පරාජයෝ 64 චන්‍දග්ගාහ 65 සුරියග්ගාහ 66 නකඛතතග්ගාහ 67 චන්දිම සුරියානං 68 චන්දිම සුරියානං උප්පථගමනං 69 නකඛත්තානං පථගමනං 70 නකඛත්තානං උප්පථගමනං 71 එවං විපාකො උක්කාපාතො 72 එවං විපාකො දිසාඩාහො 73 එවං විපාකෙ භූමිචාලො 74 එවං විපාකෝ දේවදුන්දුභි 75 එවං විපාකං චන්දම සුරිය නකඛතතානං උග්ගමනං, ඔග්ගමනං, සඞ්කිලෙසං, වොදානං. 76 සුවුට්ඨිකා 77 දුබ්බුට්ඨිකා 78 සුභික්ඛං 79 දුබ්භික්ඛං 80 ඛෙමං 81 භයං 82 රොගො 83 ආරෝග්‍යං 84 මුද්දා 85 ගණනා 86 සඞ්ඛානං 87 කාවෙය්‍යං 88 ලෝකායතං 89 ආවාහන 90 විවාහන 91 සංවදන 92 විවදන 93 සංකිරණ 94 විකිරණ 95 සුභගකරණ 965 දුබ්භගකරණ 97 විරුද්ධ ගබ්භකරණ 98 ජිව්හානිබන්‍ධන 99 හණුසංහනන 100 හත්ථාභිජප්පන 101 කණ්ණජප්පන 102 ආදාසපඤ්හ 103 කුමාරික පඤ්හ 104 දේවපඤ්හ 105 ආදිච්චු පට්ඨාන 106 මහතුපට්ඨාන 107 අබ්භුජ්ජලන 108 සිරිව්හායන 109 සන්තිකම්ම 110 පණිධිකම්ම 111 භූතකම්ම 112 භූරිකම්ම 113 වස්ස කම්ම 114 වොස්ස කම්ම 115 වත්ථු කම්ම 116 වත්ථු බලිකම්ම 117 ආචමන 118 නහාපන 119 ජුහන 120 වමන 121 විරේචන 122 උද්ධ විරෙචන 123 අධොවිරේචන 124 සීස විරේචන 125 කණ්ණ තෙල 126 නෙත්තතප්පණ 127 නත්ථුකම්ම 128 අඤ්ජන 129 පච්චඤ්ජන 130 සාලාකිය 131 සල්ලකත්තික 132 දාරකතිකිච්ඡා 133 මූලභෙසජ්ජනුප්පදාන 134 ඔසධීපටිමොක්ඛ.

12. පූජා. පි.145

13. එම; සර, පි. 1178

14. සර, පි. 1179

15. එම, පි. 160

16. පූජා, පි. 332

17. සර. පි. 802

18. ජාඇගැ, පි. 131

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
11 NOV 2017
පුස්තකාලය

19. පංච කල්‍යාණය නම්, කේශ, මාංශ, දන්ත, ඡවි සහ වයෝ කල්‍යාණ යයි; පූව, පි. 346;සර,පි. 391. කේශ, ඡවි, මංස, නහාරු, අට්ඨී ධම්පියා අටුවා ගැටපදයෙහි යන්න දක්වයි.

20. ස්ත්‍රිය යන පදය සඳහා යෙදෙන පර්යාය නාම බොහෝමයකි. එනම්, සොඳුර, ඉතිරි, බිරි, සඳ, කත්, මෙහෙලි, කල්බඳ, සිඟුවලඟ, මහගම, වමී, පියතම, අසි, දිගැසි, අඹ, අඹු, පමා, පිය නඟ, වනිති, තුණුවඟ, අඟන, විලසි, කල, යොත, පියබඳ, කුලපල්, කුලපාලී යන ස්ත්‍රී වාචක පද තිස් එකක් වේ. රුවන්පි, පි. 38; මේ හැර කව්සිළුමිණෙහි මියුලැසි ළඳ ලිය මෙන්ම රුසිරඟ යනුවෙන් ද ස්ත්‍රිය හඳුන්වා ඇත; කව්සිළුමිණ, (කව්සිළු) සංස්. කේ. ජයතිලක, කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ, 1992, පි. 234; සීගිරි ගීවල - මීලැස් යැයි ද,<u>Sigiri Grafiti</u> ,(SigiriG)Ed. S. Paranavitana, Oxford: Oxford University Press, 1956, pp. 28, 29, 48; ජාතක අටුවා ගැටපදයෙහි රුචිරෙ යනුවෙන් ද හැඳින්වේ. ***ජාඅැගැ,*** පි. 429; ගැහැනි යන්න සීගිරි ගී වලත් යෙදේ; SigiriG, pp. 203, 206, 209, 222

21. පූව. පි. 543; "ඇයගෙ ලක්‍ෂණ බලා නෛමිත්තිකයො මහත් වූ උදරතර වූ ප්‍රජාවන් ජනනද පාලන ද කරණ පරිදි කීහ. එයින් ඇය 'මහප්‍රජාපතී' නම් කළහ." ධම්ප්‍ර. පි. 218

22. පුම, පුරිස්, නර, මත්, මනව, මන්වා, මිනිස්, පුරුස්, පිරිමි, පුඟුල්, මිනි ආදී පර්යාය වචන දොළසකි. රුවන්පි; පි. 38

23. <u>කව්සිළු ii</u>, 1992, පිටු. 99, 148

24. <u>සිංහල විසුද්ධි මාර්ගය</u>, පරි. මාතර ශ්‍රී ධර්මවංශ හිමි, මාතර: සිරි මංගල පරිවේණාධාර සමිතිය, බු.ව. 2503, පි. 34

25. <u>විසුද්ධි මාර්ගය, මහාසන්නය සහිත</u>, සංස්. බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය හිමි, කළුතර: විද්‍යාතිලක මුද්‍රණාලය, 1950, පි.1058

26. <u>ධඅගැ</u>, (3 මුද්‍රණය) පි. 67

27. <u>සර</u>, පි. 802

28. <u>ධඅගැ</u>, පිටු. 231-232

29. <u>සර</u>, පි. 565



30. එම, පි. 261

31. "මහාපුරුෂ ලක්‍ෂණොපෙත නඳකුමරහු", <u>ධම්ප්‍ර</u>, පි. 218.

32. <u>මබෝවගු</u>, පි. 80

33. "මහපුරිස් ලකුණෙන් දිස්නා සිරිරු ඇති පුත් රුවනක් ලදු" <u>ධම් ප්‍ර</u>, පි. 259

34. එම, පි. 255

35. "මො තාපස වැ ජීවිකා කෙරෙයි, මැය පිතෙක් වූ කලැ චක්‍රවත්ති වෙයි" කීහු. එම, පි. 256

36. සර, පි. 563

37. අමාව, පි. 208

38. මව, පි. 144

38. විමල විජයසූරිය, <u>රුහුණේ අප්‍රකට පුරාවෘත්ත</u>, ගංගොඩවිල: තරංජි ප්‍රින්ටර්ස්, 1987, පිටු. 71-74

39. <u>වංසත්ථප්පකාසිනිය</u>, මහාවංශටීකාව, සිංහල අනුවාදය, අකුරුටියේ අමරවංස හිමි සහ හේමචන්ද්‍ර දිසනායක, කැළණිය: විශ්වවිද්‍යාලය, 1994, පි. 338

40. <u>මව</u>, 140

41. <u>සර</u>, 586

42. <u>එළුඅත්ත</u>, (කුමාරතුංග) පි. 4

43. <u>එම</u>, පි. 5

44. <u>එම</u>, පි. 12

45. <u>එම</u>, පි. 13

46. <u>සර</u>, පිටු. 256-263